# මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

## සුහුරුපාය ගොඩනැගිලි සංකීර්ණයෙහි 14,17,18, සහ 19 මහල් පිරිසිදු කිරීමේ සේවාව සැපයීම වෙනුවෙන් සේවා සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

**ලංසු කැඳවීම - 2027**

**කොන්ත්‍රාත් අංකය - PS/03/PB/02/32/26**

CONFIDENTIAL

සභාපති,

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,

17 වන මහල, "සුහුරුපාය",

ශ්‍රී සුභූතිපුර පාර,

බත්තරමුල්ල.

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1. | ලංසු ආරාධනය | 1-3 |
| 2. | **I** කොටස | |
| | 1.1 පිරිසිදු කිරීමේ සේවා සැපයීම සම්බන්ධ විස්තර හා කොන්දේසි පිළිබඳ මාර්ගෝපදේශය | 4-6 |
| 3. | **II** කොටස | |
| | 2.1 කොන්ත්‍රාත් කොන්දේසි | 7-11 |
| 4. | **III** කොටස | |
| | 3.1 ටෙන්ඩර් පත්‍රය. | 12-14 |
| | 3.2 මිල ලැයිස්තුව | 15-16 |
| | 3.3 ලංසු සුරක්ෂණය සඳහා ආකෘතිය | 17 |
| | 3.4 තාක්ෂණික පිරිවිතර | 18-21 |
| 5. | **IV** කොටස | |
| | 4.1 කොන්ත්‍රාත් ගිවිසුම | 22-32 |
| | 4.2 කාර්ය සාධන සුරක්ෂණය සඳහා ආකෘතිය | 33 |
| | 4.3 දුස්සන්දානය නොවන බවට ප්‍රකාශය | 34 |
| 6. | **V** කොටස | |
| | ඇමුණුම I **-** පිරිසිදු කිරීම සඳහා යෙදිය යුතු රසායනික ද්‍රව්‍ය | 35-39 |
| | ඇමුණුම II - පිරිසිදු කිරීම සඳහා යෙදිය යුතු උපකරණ | 40-41 |


CONFIDENTIAL

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
## මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

# ලංසු ආරාධනය

**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය සඳහා පිරිසිදු කිරීමේ හා පවිත්‍රතා සේවා සැපයීමේ සේවා සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදනය**
**කොන්ත්‍රාත් අංකය (IFB): PS/03/PB/02/32/26**

1. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් බත්තරමුල්ල පිහිටි සුහුරුපාය ගොඩනැගිල්ලේ 14, 17, 18 හා 17 මහල් වල පිහිටි කාර්යාල පිරිසිදු කිරීමේ හා පවිත්‍රතා සේවා සැපයීම වෙනුවෙන්, යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (තනි අදියර තනි කවර ලංසු කැඳවීමේ පටිපාටිය) යටතේ සිදු කරනු ලබන අතර අරමුදල් සපයන මූලාශ්‍රය ශ්‍රී ලංකා රජයයි.

3. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන් හට වැඩි විස්තර ප්‍රධාන ගණකාධිකාරි, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, වෙතින් දුරකථන අංක : 0112 887697 / විද්‍යුත් ලිපිනය : mops.procurementunit@gmail.com මගින් ලබා ගැනීමටද, ප්‍රසිද්ධ හා බැංකු නිවාඩු දින හැර සතියේ දින වලදී 2026.10.21 දින සිට 2026.11.10 වන දින දක්වා පැය 0900 සිට පැය 1500 අතර කාලයේ දී මූල්‍ය අංශය, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල හිදී හෝ අපගේ නිල වෙබ් අඩවියෙන් (www.pubsec.gov.lk) ගාස්තු රහිතව ලංසු ලිපි ලේඛන පරීක්ෂා කල හැකිය.

4. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරන ලද සියලුම ලංසුකරුවන්ට, අදාල භාණ්ඩ සැපයීමට නෛතික අයිතිය තිබිය යුතුය. ලංසුකරු තම ආයතනය ව්‍යාපාරයක් වශයෙන් ලියාපදිංචි කර තිබිය යුතු අතර, ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසුවේ වටිනාකම රු. මිලියන 05 ට වැඩිනම් 1987 අංක 3 දරණ පොදු කොන්ත්‍රාත් පනත යටතේ (Public Contract Act) ලියාපදිංචි වී තිබිය යුතුය. මෙම ලියාපදිංචි සහතිකය ලංසුව සමග ඉදිරිපත් නොකිරීම ලංසුව ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් විය හැක. ලංසුකරුට ලැදියාවන් අතර ගැටුමක් නොතිබිය යුතු අතර ලංසුකරුගේ නම රජයේ අසාදු ලේඛනයේ සඳහන් නොවිය යුතුය. අමතර විස්තර ලංසු ලිපි ලේඛනවල සපයා ඇත.

CONFIDENTIAL

5. පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත්කර මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ලංසු ලිපි ලේඛන කට්ටලයක් රුපියල් හයදහස් දෙසියයක (රු. 6,200.00) ආපසු නොගෙවනු ලබන ලංසු පෝරම ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් 2026.10.21 දින සිට 2026.11.10 වන දින දක්වා රජයේ වැඩ කරන දිනයන්හි පැය 0900 සිට පැය 1500 දක්වා කාලය තුළ ලබාගත හැක. එක් ආයතනයක් සඳහා එක් ලංසුවකට එක් ලංසු පෝරමයක් පමණක් නිකුත් කරනු ලැබේ.

6. මෙම ප්‍රසම්පානයට අදාළව ලංසු පිටපත් දෙකක් සහිතව (මුල් පිටපත / අනුපිටපත) 2026.11.11 දින පැය 14.00 ට හෝ ඊට පෙර 17 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල ලිපිනයේ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය අංශයේ තබා ඇති ලංසු බහාලනු ලබන ලංසු පෙට්ටියට බහාලීම හෝ ලංසුව විවෘත කරනු ලබන වේලාවට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් කෙලවර ඉහළ අදාළ ප්‍රසම්පාදනයේ IFB අංකය පැහැදිලිව සටහන් කර තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද පෞද්ගලිකව පැමිණ සිටීමට රිසි ලංසුකරුවන් හෝ ඔහුගේ නියෝජිතයින් ඉදිරිපිටදී අදාල ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කිරීම සඳහා සහභාගීවන ලංසුකරුවන්ගේ නියෝජිතයින් විසින් ලංසුකරුගේ ලිඛිත අවසරයක් අනිවාර්යෙන්ම රැගෙන ආ යුතුය. ලංසුකරුගේ ලිඛිත අවසරය ඉදිරිපත් කිරීමට අපොහොසත්වන කිසිඳු නියෝජිතයෙකු ලංසු විවෘත කිරීම සඳහා සහභාගී කරනු නොලැබේ.

7. ඉදිරිපත් කරනු ලබන ලංසුවල වලංගු කාලය 2026.11.11 දින සිට 2027.01.27 දින දක්වා විය යුතුය.

8. සියලුම ලංසු, රුපියල් දෙලක්ෂ හැත්තෑ අට දහසක් (රු. 278,000.00) ක වටිනාකමින් හා 2027.02.24 දක්වා වලංගු කාලයෙන් යුත් ලංසු ඇපකරයක් සමග ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරිපත් කරනු ලබන ඇපකරය පහත කොන්දේසි යටතේ විය යුතුය.
   i. වාණිජ බැංකුවක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි ආයතනයක් වෙතින් ලබාගත් ඇපකරයක් විය යුතුය.
   ii. ලංසු ඇපකර ආකෘති පත්‍රය ලංසු පෝරම කට්ටලයේ ඇතුලත් පෝරමය පරිදි විය යුතුය.
   iii. ලංසු ඇපකරය ලේකම්, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය "Secretary / Ministry of Public Security and Parliamentary Affairs " නමින් විය යුතුය.

9. සේවා සැපයිය යුතු ස්ථානීය පරීක්ෂාව සඳහා 2026.10.28 දින පැය.09.00 සිට පැය 15.00 දක්වා හැකියාව ඇත.

CONFIDENTIAL

10. කලින් කලට වෙනස් වන මුදල් රෙගුලාසි සහ භාණ්ඩාගාරයේ උපදෙස් චක්‍රලේඛයන්ට අදාලව අවශ්‍ය සංශෝධනයන් එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළදී සිදු කිරීම ප්‍රසම්පාදන කමිටුව මගින් සිදුකළ හැකි අතර, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය ලෙසට සැලකිය යුතුය.

11. <u>ලංසුකරුවන්ගේ විශේෂ අවධානයට</u>

ලංසු ලේඛන නිකුත් කිරිමේදි ඇතිවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා පැමිණීමට ප්‍රථම mops.procurementunit@gmail.com විද්‍යුත් ලිපිනයට හෝ ෆැක්ස් අංක 0112887916 වෙත අවශ්‍ය ලංසු ලේඛන පිළිබඳ තොරතුරු යොමුකර පෙර දැනුම්දීමක් සිදුකර පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

12. පහත සඳහන් ලිපිනය මගින් හෝ දුරකථන අංක මගින් මේ සම්බන්ධව වැඩිදුර විමසීම් සිදුකළ හැක.

| <u>ලිපිනය</u> | <u>දුරකථන අංක</u> |
|---|---|
| ප්‍රධාන ගණකාධිකාරි, | සෘජු දුරකථන අංකය :- 011-2887697 |
| 17 වන මහල, "සුහුරුපාය", | ෆැක්ස් අංකය :- 011-2887636/2887916 |
| බත්තරමුල්ල. | |

**සභාපති,**

**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**

**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,**

**17 වන මහල, "සුහුරුපාය",**

**බත්තරමුල්ල.**

**2026.10.21**

CONFIDENTIAL

## I කොටස

### පිරිසිදු කිරීමේ සේවා සැපයීම සම්බන්ධ විස්තර හා කොන්දේසි පිළිබඳ මාර්ගෝපදේශය

01 පහත දැක්වෙන පරිදි කොන්දේසි වලට අනුකූලව 2027 වර්ෂයට සුහුරුපාය ගොඩනැගිලි සංකීර්ණයෙහි 14,17,18, සහ 19 මහල් පිරිසිදු කිරීමේ පවිත්‍රතා කටයුතු පවත්වාගෙන යාමට ලංසු කැඳවනු ලැබේ.

02 ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් පිලියෙල කර සීල් තබන ලද කවරයක බහා පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ 17 වන මහල, “සුහුරුපාය”, බත්තරමුල්ල, මහජන ආරක්‍ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලංසු පෙට්ටියට බහාලීම හෝ හැකිය. ලංසුපත් බහා එවන කවරයෙහි වම්පස ඉහල කෙලවරෙහි “සුහුරුපාය ගොඩනැගිලි සංකීර්ණයෙහි 14,17,18, සහ 19 මහල් සනීපාරක්‍ෂක පවිත්‍රතා සේවා සැපයීම සඳහා ප්‍රසම්පාදනය” ලෙස සඳහන් කල යුතු වේ. එක් එක් ආයතනය සඳහා වෙන වෙනම ඉදිරිපත් කරනු ලබන ලංසු පිටපත් දෙකකින් මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කොට වෙනම ලියුම් කවර වල බහා ඉදිරිපත් කල යුතුය. ඔබ විසින් ඉදිරිපත් කරන **ලංසුව 2027.01.27** දින දක්වා වලංගු විය යුතු ය.

ලිපිනය :- සභාපති
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
මහජන ආරක්‍ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශ,
17 වන මහල,
“සුහුරුපාය”
බත්තරමුල්ල,

ලංසුපත් භාරගන්නා අවසාන දිනය **2026.11.11** දින ප.ව **2.00** වේ.
සේවා සැපයිය යුතු **ස්ථානීය පරීක්ෂාව සඳහා 2026.10.28 දින පෙ.ව.09.00 සිට ප.ව.03.00** දක්වා හැකියාව ඇත.

03 **<u>ලංසු ඇපකරය (Bid Bond)</u>**
සියලුම ලංසු, රුපියල් හයලක්ෂ පනස් දහසක (රු. 278,000.00) වටිනාකමින් හා 2027.02.24 දක්වා වලංගු කාලයෙන් යුත් ලංසු ඇපකරයක් සමග ඉදිරිපත් කළ යුතුය. ඉදිරිපත් කරනු ලබන ඇපකරය පහත කොන්දේසි යටතේ විය යුතුය.

iv. වාණිජ බැංකුවක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි ආයතනයක් වෙතින් ලබාගත් ඇපකරයක් විය යුතුය.

**v.** ලංසු ඇපකර ආකෘති පත්‍රය ලංසු පෝරම කට්ටලයේ ඇතුලත් පෝරමය පරිදි විය යුතුය. **(පිටු අංක 17)**

vi. ලංසු ඇපකරය ලේකම්, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය “Secretary / Ministry of Public Security and Parliamentary Affairs ” නමින් විය යුතුය.

CONFIDENTIAL

04 ටෙන්ඩර් ලංසු ඇපකරයක් නොමැතිව ලැබෙන සියළුම ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලනු නොලැබේ.

05 සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගැනීමේ ලිපියේ (Letter of Acceptance) දින සිට දින 14 ක් ඇතුලත අදාල සේවා සැපයීම ආරම්භ කිරීමට හා ලංසු සුරක්ෂණය ඉදිරිපත් කර කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමට අපොහොසත් වුවහොත් ඒ සම්බන්ධයෙන් ටෙන්ඩර් මණ්ඩලය විසින් පනවනු ලබන වෙනත් කුමන හෝ ක්‍රියාවලියකට ටෙන්ඩර්කරු යටත් විය යුතුය. එසේම එම ටෙන්ඩර්කරු අසාදු ලේඛනගත වේ.

06 මිල ගණන් වසරක් සඳහා ඉදිරිපත් කළ යුතු අතර එම කාලය තුළ මිල ගණන්වල වෙනසක් සිදු නොකල යුතු අතර රජය විසින් සේවකයන්ගේ වේතනය සම්බන්ධයෙන් සිදු කරනු ලබන ව්‍යවස්ථාපිත වෙනස්කම් වලදී කොන්ත්‍රාත්කරු ඒ අනුව සේවකයින්ට ගෙවීම් කරන බව සනාථ කළ පසු එම අතිරේක ගෙවීම පිළිබඳ සලකා බලනු ලැබේ.

07 තනි පුද්ගල ව්‍යාපාරයක්, හවුල් ව්‍යාපාරයක් හෝ සීමිත සමාගමක් වශයෙන් ලියාපදිංචි වී තිබිය යුතු අතර, ISO සහතිකය ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

08 මිල ගණන් ප්‍රතික්ෂේප කිරීම හෝ පිළිගැනීමට මිලදී ගැනීමේ බලය ටෙන්ඩර් මණ්ඩලයට ඇත.

09 සනීපාරක්‍ෂක සේවා හා පිරිසිදු කිරීමේ සේවා සැපයීම සඳහා වන කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ල කිසිදු හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ආයතනයේ ටෙන්ඩර් මණ්ඩලය සතු වේ.

10 ඉහත කොන්දේසි වලින් ආවරණය නොවූ යම් කරුණක් වේ නම් එය ආයතනයේ ආයතන ප්‍රධානියාගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

**11 <u>ටෙන්ඩර් කොන්දේසි.</u>**

11.1 ටෙන්ඩර්පත් සමග පහත සඳහන් ලියවිලි වල පිටපත් අමුණා එවිය යුතුය.

- නිවැරදිව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රයේ මුල් පිටපත (පිටු අංක 12-14)
- නිවැරදිව සම්පූර්ණ කරන ලද මිල ලැයිස්තුවේ මුල් පිටපත (පිටු අංක 15-16)
- ලංසු ඇපකරයේ මුල් පිටපත (ආකෘතිපත්‍රය - පිටු අංක 17)
- නිවැරදිව සම්පූර්ණ කරන ලද තාක්ෂණික පිරිවිතරය (පිටු අංක 19-21)
- දූස්සන්දානය නොවන බවට ප්‍රකාශය (ආකෘතිපත්‍රය - පිටු අංක 34)
- නිවැරදිව සම්පූර්ණ කරන ලද පිරිසිදු කිරීම සඳහා යෙදිය යුතු රසායනික ද්‍රව්‍ය ලැයිස්තුවේ මුල් පිටපත (පිටු අංක 36-39)
- නිවැරදිව සම්පූර්ණ කරන ලද පිරිසිදු කිරීම සඳහා යෙදිය යුතු උපකරණ ලැයිස්තුවේ මුල් පිටපත (පිටු අංක 40-41)
- ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපත
- වැට් සඳහා ලියාපදිංචි සහතිකයේ පිටපතක්

CONFIDENTIAL

- EPF  හා ETF සඳහා ලියාපදිංචි සහතිකයේ පිටපතක්
- පසුගිය වසර 03 ආදායම් බදු සඳහා ගෙවන ලද බවට සනාථන ලේඛන
- පසුගිය මාස 12 තුළ VAT සඳහා ගෙවන ලද බවට සනාථන ලේඛන
- පසුගිය මාස 12 තුළ EPF සඳහා ගෙවන ලද බවට සනාථන ලේඛන
- පසුගිය මාස 12 තුළ ETF සඳහා ගෙවන ලද බවට සනාථන ලේඛන
- පසුගිය වසර 03 සඳහා මූල්‍ය වාර්තා (2025, 2024, 2023)
- PCA 3 සහතිකයේ මුල් පිටපත
- දැනට සේවය කරන ස්ථාන වල ලැයිස්තුව.
- දැනට සේවය කරන ස්ථාන වලින් ලබාගත් සහතිකය.
- ආයතනයේ වත්මන් සේවක ධාරිතාව පිළිබඳ තොරතුරු (කාන්තා හා පිරිමි වෙනවෙනම)
- ටෙන්ඩර් පත්‍රිකාවේ අත්සන් කිරීම ආයතන ප්‍රධානී නොවන අවස්ථාවකදී ආයතන ප්‍රධානී විසින් වෙනත් නිලධාරයකුට බලය පැවරූ සහතිකය
- යොදා ගැනීමට නියමිත පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය ලැයිස්තුව සහ ඒ සඳහා ලබාගෙන ඇති තත්ව සහතික
- ISO සහතිකය ඇත්නම් - එය විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ

11.2 ටෙන්ඩර් පත්‍රිකාවේ සඳහන් මිල වෙනස් කිරීමේදී වැරදි නිවැරදි කිරීමකදී කෙටි අත්සන් යොදා තිබිය යුතුය.

11.3 අදාළ ගාස්තු නොගෙවූ සහ ඡායා පිටපත් කරන ලද ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.4 ඉදිරිපත් කරනු ලබන මිල ගණන්, සේවාව සඳහා ගිවිසගත් දින සිට වර්ෂයක් (දින 365) සඳහා වලංගු වේ.

11.5 කොන්ත්‍රාත්තුව වෙනත් උප  කොන්ත්‍රාත්කරුවෙකුට පැවරීම නොකල යුතුයි.

11.6 ටෙන්ඩර් විවෘත කිරීමෙන් පසුව එය ඉල්ලා අස් කර ගැනීමට හෝ මිල ගණන් වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

11.7 එක් අයෙකුට/ ආයතනයකට ඉදිරිපත් කල හැක්කේ එක් ටෙන්ඩර් පත්‍රිකාවක් පමණි.

11.8 සේවා සැපයුම සම්බන්ධව ආයතන ප්‍රධානීන් හෝ ඔහු විසින් බලය පවරන නිලධාරියෙකු සමග ගිවිසුමකට එළඹිය යුතුය.

11.9 සේවක පැමිණීම, සේවා සැපයීම් පිළිබඳව අදාල අංශ වලින් ලැබෙන පැමිණිලි පිළිබඳව සලකා බැලීම හා ලොග් සටහන් පරීක්ෂාකර බැලීම යටත්ව මාසික බිල්පත් ගෙවීම් කරනු ලැබේ.

11.10 ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් අයදුම්පත සම්පූර්ණ කර අත්සන් කල යුතුය.

11.11 ඉදිරිපත් කරන සියළුම මිල ගණන් පැහැදිලිව තීන්තෙන් ලියා හෝ යතුරු ලියන කොට ඉලක්කමෙන් සහ අකුරෙන් ලියන ලද මිල ගණන් නිවැරදි ලෙස පිලිගැනේ.

111.2 සංශෝධන කිසිවක් කර ඇත්නම් ටෙන්ඩර්කරු ඒ සඳහා කෙටි අත්සන යෙදිය යුතුය. එසේ නොකොට ඉදිරිපත් කරනු ලබන මිළ ගණන් අවිධිමත් ඒවා ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## II කොටස

# කොන්ත්‍රාත් කොන්දේසි

**01 <u>සේවයේ යොදවන සේවකයන් සඳහා වන විශේෂ කොන්දේසි.</u>**

01.1 පිරිසිදු කිරීම් සඳහා පැමිණි සේවක සංඛ්‍යාව අඩු වුවහොත් ප්‍රමාණවත් පරිදි තම සේවාවන් සපයමින් පිරිසිදු කිරීමේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට සේවයට පැමිණ සිටින සේවකයින් කටයුතු කල යුතුය.

01.2 පිරිසිදු කරන්නන් හා වැඩ පරීක්ෂක ආයතනයට ගැළපෙන ප්‍රසන්න නිල ඇඳුමකින් සැරසී හැඳුනුම්පත පැළඳ සිටිය යුතුය. (නිල ඇඳුම කාන්තා පිරිමි දෙපාර්ශවය සඳහාම ආයතනයේ ලාංඡනය සහිතව කමිසයකින් හා කලිසමකින් සැරසීම අවශ්‍ය වේ. රබර් පාවහන් පැළඳීමෙන් වැලකිය යුතුය). (වැඩ පරීක්ෂකගේ නිළ ඇඳුම සේවකයන් නිල ඇඳුමෙන් වෙනස් විය යුතුය). පිරිමි සේවකයින් කොණ්ඩය කොටට කැපිය යුතු අතර කාන්තා සේවිකාවන් කොණ්ඩය කැපීම හෝ බැඳීම අවශ්‍ය වේ.

01.3 පිරිසිදු කිරීමේ සේවයකයින් ආයතනයේ සියළුම මට්ටමේ නිලධාරීන්ටත්, සේවකයින්ටත් මෙම ආයතනයට බාහිරින් පැමිණෙන්නන්ටත් ආචාරශීලී විය යුතුය.

01.4 සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 7.00 සිට ප.ව. 4.00 දක්වාත්, සෙනසුරාදා පෙ.ව. 7.00 සිට ප.ව. 2.00 දක්වාත් සේවාව සැපයිය යුතුය (කාර්යාලයට පැමිණීමේ වේලාව සඳහා මිනිත්තු 15ක අතිරේක කාලයක් ලබා දෙනු ලැබේ; කෙසේ වෙතත්, ප්‍රමාද වී පැමිණීම හේතුවෙන් මග හැරෙන කාලය ප.ව. 4.00න් පසුව ආවරණය කළ යුතුය). සියළු පිරිසිදු කිරීම් පෙ.ව 08.15 වන විට අවසන් කල යුතු අතර නිතර පිරිසිදු කිරීමට යටත්වන පරිශ්‍රයන් කෙරෙහි අවධානයෙන් යුතුව සේවකයන් සේවයේ යෙදවිය යුතුය.

01.5 පිරිසිදු කිරීම් සඳහා භාවිතා කරන විෂබීජ නාශක හෝ රසායනික ද්‍රව්‍ය උසස් තත්වයේ ඒවා විය යුතුය. **(භාවිතා කිරීමට යෝජිත රසායනික ද්‍රව්‍ය හෝ විෂබීජ නාශක වල නම් සහ ඒ සඳහා ලබාගෙන ඇති තත්ව සහතික අයදුම්පත සමග ඉදිරිපත් කල යුතුය).**

01.6 කිසිම කාර්යාලීය උපකරණයකට හෝ භාණ්ඩයකට හානි වන ලෙස කටයුතු නොකල යුතු අතර දූර්වරණවීමට ඉඩ නොදිය යුතුය. එසේ වුවහෙත් අලාභය ටෙන්ඩර්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.

01.7 පිරිසිදු කිරීමේ කටයුතු වල යෙදෙන කිසිදු සේවකයෙකුට ආයතනයේ සේවකයන්ට හිමි වරප්‍රසාද හෝ පහසුකම් සපයනු නොලැබේ. රාජකාරි වේලාවන්හි හැර අනෙකුත් වේලාවන්හිදී කාර්යාල භූමියේ රැඳී නොසිටීමට වග බලා ගත යුතුය.

CONFIDENTIAL

01.8 කොන්ත්‍රාත්තුවේ කටයුතු අසතුටුදායක බව පෙනී ගියහොත් ඕනෑම අවස්ථාවක මාසයක දැනුම් දීමකින් සේවය නතර කිරීමට සහ නැවත ටෙන්ඩර් කැඳවීමට හෝ වෙනත් විකල්ප ක්‍රියාමාර්ගයක් ගැනීමට ආයතන ප්‍රධානියාට බලය ඇත.

01.9 සේවය සඳහා යොදා ගන්නා සියළුම සේවකයින්ගේ ග්‍රාම සේවක සහතිකය, පොලිස් වාර්තාව සහ ජාතික හැඳුනුම්පත්වල සහතික පිටපත් ආයතනය වෙත ලබා දිය යුතුය. අවශ්‍ය අවස්ථාවක පරීක්ෂාකර බැලීම සඳහා ග්‍රාම සේවා නිලධාරීන්ගේ සහතිකවල මුල් පිටපත් කොන්ත්‍රාත්කරු වෙත තිබිය යුතුය.

01.10 සියළුම සේවක / සේවිකාවන් වයස අවුරුදු 18 ත් 60 ත් අතර හොඳ ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය. (වයස් සීමාව පිළිබඳව සැලකිලිමත් විය යුතුය. සේවකයින්ගේ අනන්‍යතාවය පිළිබඳ සැලකිලිමත්විය යුතුය.)

01.11 පවිත්‍රතා කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව සම්බන්ධව පවත්වාගනු ලබන ලේඛණය අවශ්‍ය අවස්ථාවලදී පරීක්ෂාකර බැලීමට ඉදිරිපත් කල යුතුය.

01.12 සේවකයන් මාරු කරන (එක් සේවකයෙකු වෙනුවට අළුතින් වෙනත් සේවකයෙකු යොදවන) සෑම අවස්ථාවකම ආයතනය දැනුවත්කර සේවයේ සිටින්නන් 05.9 සඳහන් සහතික ලබා දිය යුතුය.

01.13 සේවයේ යොදවන සියළුම සේවකයින් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

01.14 මනා පළපුරුද්දකින් හා සේවකයන් පාලනය කිරීමේ හැකියාවකින් යුතු අධීක්ෂකවරයෙක් පැමිණීමට අපොහොසත් වුවහොත් එම දිනය ආවරණය කිරීම සඳහා වෙනත් අධීක්ෂණවරයෙක් යෙදවීම අනිවාර්ය වේ.

01.15 කාර්මික දෝෂ සියල්ලක්ම ඉංජිනේරු අංශයට දැනුම්දී සිදුකරගැනීමට අවශ්‍යයයි.

01.16 වැකුම් ක්ලීනර්, (පොඩි සහ ලොකු) මකුළු දැල් කඩන කොසු, ඩස් පෑන්, හෑන් බ්‍රෂ්, මැෂින් (බ්‍රෂින් වලට) ෂැම්පු මැෂින් සහ අනෙකුත් පිරිසිදු කිරීම් වලට රැගෙන එන ද්‍රව්‍ය හා භාණ්ඩ ලේඛණ ගත කළ යුතුවේ.

**02** **<u>පොදු කොන්දේසි.</u>**

02.1 සියලුම සේවකයින් සහ අධීක්ෂකවරුන් අමාත්‍යාංශයේ නීති රීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය.

02.2 ටෙන්ඩරය පිළිගැන්වීමෙන් පසුව අදාල සේවා සැපයීම ආයතනය විසින් සේවයේ යොදවනු ලබන සියළුම සේවකයින් සඳහා රජයේ පඩි පාලක සභා පනතට හා සේවා කොන්දේසි යටතේ කටයුතු කළයුතු අතර, ඒ සම්බන්ධයෙන් වන කිසිදු අරමුදලකට හෝ වෙනයම් බැඳීමකට ආයතනයේ හෝ එහි කිසිදු නිලධාරියෙක් යටත් නොවේ.

CONFIDENTIAL

02.3 ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමේදී ඉල්ලා ඇති පරිදි සේවක සංඛ්‍යාව සේවයෙහි යෙදවිය යුතු අතර එම සේවකයන් ඉහත සඳහන් වයස් කාණ්ඩයට අයත්විය යුතු අතර, මෙම සේවක සංඛ්‍යාව නිරන්තරව සේවයේ යෙදී සිටිදැයි යන්න පිළිබඳව පරීක්ෂා කිරීමට ආයතනයේ නිලධාරීන්ට බලය ඇති අතර, ඒ පිළිබඳව දෛනික ලේඛණයක් ඔබ විසින් පවත්වාගෙන යා යුතුය. ගොඩනැගිල්ලේ පැවැත්වෙන අමතර උත්සවයන් අවසන්වන තුරු වැසිකිලි පිරිසිදු කිරීමට පුද්ගලයන් යෙදවීමට අවශ්‍ය වේ.

02.4 සියලුම පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් හා පැමිණීමේ ලේඛණ මගින් තම පැමිණීම සටහන් කළ යුතුය. මාසික ගාස්තු නිරවුල් කිරමේදී අදාල පැමිණීමේ ලේඛණ පරීක්ෂාකර බලා නිර්දේශ සටහන් කිරීමට අමාත්‍යාංශ පාලන අංශය වෙත බලය පැවරේ.

02.5 කොවිඩ් - 19 වෛරසය වැනි රෝග මැඩපැවැත්වීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙත පැහැදිලිව ඉදිරිපත් කල යුතු අතර, එහි වගකීම වැඩ පරීක්ෂක විසින් දැරිය යුතුය.

**03 <u>කාර්ය සාධන බැඳුම් ඇපකරය. (Performance Bond) – (Annexure 3)</u>**

03.1 සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරයේ වාර්ෂික වටිනාකමින් 10% (සියයට 10කට) සමාන වටිනාකමකින් යුතු පිළිගත් බැංකුවකින් ලබාගත් බැංකු ඇපකරයක් ආයතනය වෙත ඉදිරිපත් කල යුතුය. තෝරාගත් ටෙන්ඩර්කරුගේ සේවා ඉටුකිරීමේ අසතුටුදායක බව ටෙන්ඩර් මණ්ඩලයට පෙනීගියහොත් සහ ඔහු සිය කොන්ත්‍රාත්තුවේ කුමන හෝ කොන්දේසියක් කඩකර ඇත්නම් ඔහුට එම කාර්ය සාධන බැඳුම්කරය අහිමි වන අතර කොන්ත්‍රාත්තුවද අවසන් වේ.

**04 <u>දැනුම්දීම</u>.**

04.1 තෝරාගන්නා මිල ගණන් ඉදිරිපත් කරන ලද සේවා ආයතනයකට ටෙන්ඩර්ය පිළිගැනීමේ ලිපිය විද්‍යුත් ලිපිනය මගින් දන්වා එවනු ලබන අතර නිවැරදිව හා පැහැදිලිව විද්‍යුත් ලිපිනය සඳහන් කළ යුතුය. ලිපියේ දින සිට දින 07 ක් ඇතුලත අදාල සේවා සැපයීම ආරම්භ කළ යුතුය. එලෙස සේවා සැපයීම නොකළහොත් ඊලග මිල ගණන් ඉදිරිපත් කරන ලද සේවා සැපයීම් ආයතනයකට ටෙන්ඩරය පිරිනැමීමට කටයුතු කරනු ලැබේ.

**05 <u>කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීම</u>.**

05.1 තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින් ආයතන ප්‍රධානියා සමග කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කල යුතුය. එමෙන්ම කොන්ත්‍රාත්තුවේ වැඩ නියමිත ආකාරයට සිදුකිරීමටත්, කලට වේලාවට එම රාජකාරිය නිම කිරීමටත්, සහතික කරනු පිණිස ටෙන්ඩරය පිළිගත් විගසම ටෙන්ඩර්කරු වෙතින් පිළිගතහැකි සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කිරීමට ටෙන්ඩර්කරු බැඳී සිටිය යුතුය.

05.2 සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගැනීමේ ලිපිය (Letter of Acceptance) ලැබී දින 14ක් ඇතුලතදී කාර්ය සාධන ඇපකරය ඉදිරිපත් කලයුතු අතර ආයතන ප්‍රධානී හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු ගිවිසුම අත්සන් කල යුතුය.

CONFIDENTIAL

**06** **<u>වැටුප්</u>**

06.1 මෙම වැටුප් කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් සේවයේ යොදවනු ලබන සෑම අංශයකම සේවකයෙකු සඳහා කොන්ත්‍රාත්කරු විසින් සේවක වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් බලපැවැත්වෙන හෝ මතුවට පැනවිය හැකි නීති හා රෙගුලාසි වලට අනුව වැටුප් ගෙවිය යුතුය. (පඩි පාලක ආඥා පනතේ රෙගුලාසි හා පඩි පාලක සභා තීරණය අනුව හා සේවක අර්ථ සාධක හා සේවා අරමුදල් අවශ්‍යතා අනුව).

**07** **<u>නීතිය අදාළ වීම.</u>**

ටෙන්ඩර්පත එමගින් පනවනු ලබන කොන්ත්‍රාත්තු ශ්‍රී ලංකාවේ නීතිය මගින් පාලනය කරනු ලැබේ.

08 බේරුම් කිරීම, කොන්ත්‍රාත් ගිවිසුම තුලින් පැන නගින ආරවුල් සම්බන්ධයෙන් 1995 අංක 11 දරණ බේරුම් කිරීමේ පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතුය.

09 සනීපාරක්ෂක සේවා සැපයිය යුතු ස්ථාන වෙනුවෙන් හඳුන්වනු ලබන්නේ ටෙන්ඩර් අයදුම්පතෙහි දක්වා ඇති සුහුරුපාය ගොඩනැගිලි සංකීර්ණයෙහි 14,17,18, සහ 19 මහල් පවිත්‍රතා හා සනීපාරක්ෂක කටයුතු සඳහා අවශ්‍ය සේවක සේවිකාවන් සේවයේ යෙදවිය යුතු ස්ථානයන් වේ.

**10** **<u>ගෙවීම් කරනු ලබන ක්‍රමය</u>**

10.1 සහතික කරන ලද පැමිණීම සහ අනුමත කරන ලද ආකෘති පත්‍රවල සේවා සැපයීම සඳහා භාවිතා කරනු ලබන ගෙවීම් වවුචරය ඉදිරිපත් කිරීමෙන් සනීපාරක්ෂක හා පවිත්‍රතා සේවා සැපයීම් සඳහා භාවිතා කරනු ලබන ගෙවීම් වවුචරය ඉදිරිපත් කල දිනයේ සිට වැඩ කරන දින 10ක් ඇතුලතදී චෙක්පතකින් ලබාගත හැකිය. වවුචර් පත්‍රය සමග යථා පරිදි අත්සන් කරන ලද බිල්පත් සහ අනෙකුත් අදාළ ලියවිලිද ඉදිරිපත් කල යුතුය.

10.2 සියළුම වවුචර්පත් මසක් ඇතුලතදී ගෙවීම් සඳහා බලධාරියා වෙත ඉදිරිපත් කල යුතුය. දෙසැම්බර් මස වවුචර්පත්‍ර මුදල් වර්ෂය අවසන් කරනු ලබන දිනයට වැඩ කරනු ලබන දින 03 කට කලින් ඉදිරිපත් කල යුතුය. මෙකී දිනයට පසුව ඉදිරිපත් කරනු ලබන වවුචර්පත් සම්බන්ධයෙන් ගෙවීම් ප්‍රමාද වනු ඇත.

**11** **<u>කොන්ත්‍රාත් අවසන් කිරීම</u>**

පහත හේතු මත කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට අමාත්‍යාංශය වෙත බලය ඇත.

11.1 ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් තම පැමිණීම සටහන් නොකිරීම.

11.2 පැමිණීමේ ලේඛණය අත්සන් නොකිරීම.

11.2 ව්‍යාජ අත්සන් යෙදීම.

11.3 කොන්ත්‍රාත්තුව මගින් නියමිත කරන ලද සංඛ්‍යාව සේවයේ නොයෙදවීම.

11.4 අවශ්‍ය ප්‍රමිතීන්ට අනුව සේවාව නොසැපයීම පිළිබඳව දැන්වීමෙන් පසුවද ප්‍රගතියක් ඇති නොවන අවස්ථා වලදී

CONFIDENTIAL

**12 කොන්ත්‍රාත්තුවේ සේවා කාලය දීර්ඝ කිරීම**

12.1 ටෙන්ඩර් අයදුම්පත්‍රයේ කොන්දේසි හා උපදෙස් සහ ගිවිසුමේ දක්වා ඇති ආකාරයට කොන්ත්‍රාත්කරු විසින් සනීපාරක්ෂක හා පවිත්‍රතා පවත්වාගෙන යා යුතුය.

12.2 කොන්ත්‍රාත්කරුගේ එකඟත්වය ඇතිව අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයට කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් නියමිත කර ඇති කොන්ත්‍රාත්තුවේ සේවා කාලය දීර්ඝ කිරීමට හැකිය.

**13 පොදු විධාන**

13.1 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත හෝ ඒ පිළිබඳ කුමන හෝ ව්‍යවස්ථාපිත සංශෝධන වෙනස් කිරීමක් හෝ දීර්ඝ කිරීමක් යටතේ කොන්ත්‍රාත්කරුගේ කුමන හෝ සේවකයෙකු විසින් හෝ සේවකයෙකු සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් විසින් හෝ සේවකයෙකු සම්බන්ධයෙන් කරනු ලබන හිමිකම් පෑමක් සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී විසින් වගකියනු නොලැබේ.

13.2 සනීපාරක්ෂක හා පවිත්‍රතා සේවා සැපයීමේදී එම සේවාවේ අඩුපාඩු සම්බන්ධයෙන් පහත සඳහන් දඩ මුදලක් නියම කරනු ලැබේ. මෙම අඩුකිරීම් නැවත සේවකයාගේ වැටුපෙන් අඩුකිරීම් කොන්ත්‍රාත්කරු විසින් නොකල යුතුවේ.

(අ) දිනක රාජකාරියට අවශ්‍ය සේවකයන් සංඛ්‍යාව ටෙන්ඩරයේ සඳහන් ප්‍රමාණයට වඩා අඩු වන සෑම දිනකම අඩු වන සේවකයින් ගණනට සාපේක්ෂව දිනක වැටුප බැගින්.
(ආ) රාජකාරියට වාර්තා කර නිසි පරිදි රාජකාරියේ යෙදී නොසිටීම වෙනුවෙන් දිනක වැටුප බැගින්.
(ඇ) සේවයේ යෙදී සිටින සේවකයින් නිල ඇඳුමින් සැරසී නොසිටීම වෙනුවෙන් එක් පුද්ගලයෙකුට රු. 50ක් බැගින් අයකරනු ලැබේ.

14 සනීපාරක්ෂක හා පවිත්‍රතා සේවා පවරා ඇති භූමියේ සොරකම් කිරීම සහ අලාභහානි කිරීම සම්බන්ධයෙන් ආයතනයට සිදුවන පාඩු සම්බන්ධයෙන් එම වටිනාකමට අමතරව 25% (සියයට 25ක) රජයේ ගාස්තුද ඇතුලත්ව කොන්ත්‍රාත්කරුහට අධිභාර නියමය පනවනු ලැබේ.

15 සනීපාරක්ෂක හා පවිත්‍රතා සේවා කරගෙන යෑමේදී කොන්ත්‍රාත්කරුගේ සේවකයන් විසින් කරනු ලබන අධීක්ෂණ කටයුතුවලට අමතර සේවකයාගේ රාජකාරි ඉටුකිරීම පිළිබඳව විටින් විට ආයතන විසින් හෝ ඔහු විසින් පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් සිදුකරනු ඇත. එවැනි අධීක්ෂක කටයුතු දිවා රාත්‍රී කාලයේදී ඕනෑම වේලාවක සිදුකිරීමට හැකිය.

16 කොන්ත්‍රාත්තුකරු විසින් ඇපකර වශයෙන් තැන්පත් කරනු ලබන මුදල්වලට කිසිදු පොලියක් ගෙවනු නොලැබේ.

17 දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන රෙගුලාසි මත ගෙවිය යුතුවන බදු ගෙවීමට කොන්ත්‍රාත්කරු යටත්වනු ඇත.

CONFIDENTIAL

## III කොටස

### 3.1 ටෙන්ඩර් පත්‍රය.

01. ලංසුකරුගේ/ ආයතනයේ ලියාපදිංචි නම : ................................................................................................
.........................................................................................................................................

02. ලියාපදිංචි අංකය : .........................................................................................................................
(ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡායා පිටපත සඳහා ඇමුණුම.......... බලන්න)

03. ලිපිනය : ...................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................

04. දුරකථන අංකය : ....................................................... ෆැක්ස්: ........................................

05. විද්‍යුත් ලිපිනය (පැහැදිලි අකුරින් සඳහන් කරන්න) : .........................................................................

06. ශාඛා කාර්යාල තිබේනම් ඒවායේ ලිපිනයන් හා දුරකථන අංක :- (වැඩි විස්තර සඳහා ඇමුණුම ........... බලන්න)

07. ආයතනයේ අයිතිකරුවෝ/අධ්‍යක්ෂ මණ්ඩලය

| | නම | පෞද්ගලික ලිපිනය |
|---|---|---|
| I. | ........................................................ | ........................................................ |
| II. | ........................................................ | ........................................................ |
| III. | ........................................................ | ........................................................ |
| IV. | ........................................................ | ........................................................ |
| V. | ........................................................ | ........................................................ |

(මෙය ප්‍රමාණවත් නොවන්නේ නම් වෙනත් ඇමුණුමක් මඟින් අදාල විස්තර ඉදිරිපත් කරන්න)

08. ආදායම් බදු ලිපිගොනුවේ අංකය: ....................................................................................
(පසුගිය වර්ෂ 3 සඳහා ගෙවීම් පිළිබඳ වාර්තා ඉදිරිපත් කළ යුතුය)

09. එකතු කළ අගය මත බදු අංකය :..................................................................
(පසුගිය වර්ෂයේ ගෙවීම් පිළිබඳ වාර්තා ඉදිරිපත් කළ යුතුය)

10. I. සේවක අර්ථසාධක අරමුදල් අංකය: ............................................................
(ඉහත ගෙවීම් සනාථ කිරීම සඳහා පසුගිය මාස 12ක ගෙවීම් සහතික හා ලේඛන ඉදිරිපත් කළ යුතුය.)

CONFIDENTIAL

II. සේවක භාරකාර අරමුදල් අංකය: ..................................................................

(ඉහත ගෙවීම් සනාථ කිරීම සඳහා පසුගිය මාස 12ක ගෙවීම් සහතික හා ලේඛන ඉදිරිපත් කළ යුතුය.)

11. ආයතනයේ මුල්‍යමය හැකියාව සනාථ කරන ලේඛන ඉදිරිපත් කර තිබේ ද? යන වග:

.......................................................................................................................

(පසුගිය වර්ෂ 3ක විගණනය කරන ලද වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කළ යුතුය.)

12. සේවා සැපයීම සඳහා මාසිකව ඉල්ලුම් කරන මුළු මුදල

| **කාලය** | **බදු රහිත (රුපියල්)** | **බදු සහිත (රුපියල්)** |
|---|---|---|
| සම්පූර්ණ මාසික මුදල | | |
| සම්පූර්ණ වාර්ෂික මුදල | | |

(ලංසු ඉල්ලුම්පත් III කොටස් 3.2ට අදාලව ඉහත මුදල ඉදිරිපත් කළ යුතුය.)

13. සේවා අවශ්‍යතාවය මත කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සඳහා ඔබ එකඟ වන්නේ ද?

...................................................................................................................................

14. ආයතනය විසින් දැනට සේවා සපයනු ලබන ආයතන පිළිබඳ විස්තර

| ආයතනයේ නම හා ලිපිනය | කොන්ත්‍රාත් කාලය | **දුරකථන අංකය** | යොදවන ලද සේවක සංඛ්‍යාව | වාර්ෂික මුදල (රු.) |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

(මෙය ප්‍රමාණවත් නොවන්නේ නම් වෙනත් ඇමුණුමක් මගින් අදාල විස්තර ඉදිරිපත් කරන්න)

CONFIDENTIAL

15. දැනට ආයතනය සතු කාර්ය මණ්ඩල ප්‍රමාණය: ........................................................

16. වහාම සේවයේ යෙදවීම සඳහා ආයතනයට සැපයිය හැකි සේවක ප්‍රමාණය:......................

17. යම් සේවා සැපයුම් ආයතනයක් විසින් මීට පෙර ඔබේ සේවා සැපයුම අත්හිටුවා තිබේද? ..........................................................................................................................................

18. සේවා සැපයුම සඳහා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ සේවය හැර ගිය පුද්ගලයින් බඳවාගෙන තිබේ ද? ....................................................................................................................

19. ආදායම් බදු හෝ රජයට ගෙවිය යුතු බදු මුදලක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් ඔබ ආයතනය අධිකරණයේ දී වරදකරු වී තිබේ ද? ......................................

මා විසින් ඉහත සඳහන් කරන ලද තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් ප්‍රකාශ කරමි. තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පවත්නා නීති රීතිවලට හා කලින් කල හඳුන්වා දෙනු ලැබිය හැකි නීති රීතිවලට එකග වන බව ද, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ පවත්නා නීති රීතිවලට හා කලින් කලට හඳුන්වා දෙනු ලැබිය හැකි නීති රීති හා කොන්දේසිවලට එකඟ වන බවද ප්‍රකාශ කර සිටිමි. මාගේ සේවා සැපයුමේ අසාර්ථකභාවය හෝ ලංසු කොන්දේසි හෝ වෙනත් නීති රීති උල්ලංඝනය කිරීම යන ඕනෑම කාරණයක් හේතු කොටගෙන මගේ සේවා සැපයුම අවලංගු කිරීමට හෝ වෙනත් දඬුවමකට යටත් වීමට එකඟ වන බව ද ප්‍රකාශ කර සිටිමි.

කොන්ත්‍රාත්කරුගේ අත්සන :- ......................................................................

නම :- ......................................................................

තනතුර :- ......................................................................

නිල මුද්‍රාව :- ......................................................................

දිනය :- ......................................................................

## 3.2 මිල ලැයිස්තුව

| විස්තරය | එක් පුද්ගලයෙකු සඳහා වන ගාස්තුව (රු.) | පුද්ගලයින් ගණන | | | | | දින ගණන | මාසික පිරිවැය (රු.) | වාර්ෂික පිරිවැය (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 14 වන මහල (වර්ග අඩි 22247.05) | 17 වන මහල හා 'පියස' (Piyasa) හි පොලිස් නිෂ්කාශන ඒකකය (වර්ග අඩි 19937.86) | 18 වන මහල (වර්ග අඩි 18055.37) | 19 වන මහල (වර්ග අඩි 1130.21) | එකතුව | | | |
| වැඩ පරීක්ෂක (පිරිමි) | | 1 | 1 | - | - | 2 | 26 | | |
| වැඩ පරීක්ෂක (ගැහැණු ) | | 1 | - | 1 | - | 2 | 26 | | |
| කම්කරු (පිරිමි) | | 2 | 2 | 2 | - | 6 | 26 | | |
| කම්කරු (ගැහැණු) | | 4 | 4 | 4 | 1 | 13 | 26 | | |
| සැපයුම් ද්‍රව්‍ය වියදම් | | | | | | | | | |
| | | | | | | | | | |
| මුළු ගාස්තුව (බදු රහිතව) | | | | | | | | | |
| වැට් බදු | | | | | | | | | |
| මුළු ගාස්තුව (බදු සහිතව) | | | | | | | | | |

- සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 7.00 සිට ප.ව. 4.00 දක්වාත්, සෙනසුරාදා පෙ.ව. 7.00 සිට ප.ව. 2.00 දක්වාත් සේවාව සැපයිය යුතුය

කොන්ත්‍රාත්කරුගේ අත්සන :

නිල මුද්‍රාව :

CONFIDENTIAL

| විස්තරය | මූලික වැටුප | දීමනා | EPF 12% | ETF 3% | එකතුව |
|---|---|---|---|---|---|
| වැඩ පරික්‍ෂක (පිරිමි) | | | | | |
| වැඩ පරික්‍ෂක (ගැහැණු ) | | | | | |
| කම්කරු (පිරිමි) | | | | | |
| කම්කරු (ගැහැණු) | | | | | |

දිනක සේවා මුරයට අමතරව පවිත්‍රතා සේවා ලබාගැනීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා එක් අයෙකුට පැයක් සඳහා ගෙවිය යුතු අතිකාල ගෙවීම් ප්‍රමාණයන් දක්වන්න.

| සේවය | එක් අයෙකු සඳහා පැයකට ගෙවිය යුතු අතිකාල මුදල (රු.) |
|---|---|
| වැඩ පරීක්ෂක | |
| පවිත්‍රතා සේවක | |

කොන්ත්‍රාත්කරුගේ අත්සන : ......................................................................

නිල මුද්‍රාව :

CONFIDENTIAL

## 3.3 ලංසු සුරක්ෂණය සඳහා ආකෘතිය

# Bid Guarantee

*[This Bank Guarantee from shall be filled in accordance with the instructions indicated in brackets]*

................... *[insert issuing agency's name, and address of issuing branch or office]*..........

*** Beneficiary:** Secretary, Ministry of Public Security and Parliamentary Affairs,
18th Floor, Suhurupaya,
Battaramulla.

**Date :** **-------------** *[insert (by issuing agency) date]*

**Bid Guarantee No: ----------------** *[insert (by issuing agency) number]*

we have been informed that ---------------*[ insert(by issuing agency) name of the Bidder; If a joint venture, list complete legal names of partners]* ( hereinafter called "the Bidder ") has submitted to you its Bid dated ----------- *[insert (by issuing agency) date] (*hereinafter called "the Bid") for the supply of *[insert name of supplier]* under invitation for Bids. No--------------------------- Furthermore, we understand that, according to your quotation, Bids must be supported by a Bid guaranty

At the request of the Bidder, we ------------------- (*insert name of issuing agency*) hereby irrevocably under take to pay you any sum or sums not exceeding in total and amount of ---------------- (*insert amount in figures*) ----------------- [*insert amount in wards ]* upon receipt by us of your first demand in writing accompany by a written statement starting that the Bidder is in breach of its obligation(s) under the bid conditions, because the Bidder.

(a) has withdrawn its Bids during the period of bid validity specified; or

*(b)* does not accept the correction of errors in accordance with instructions to Bidders (hereinafter "the ITB "); or

(c) having been notified of the acceptance of its Bid by the Purchaser during the period of bid validity, (i) fails or refuses to execute the contract from, if required, or (ii) fails or refuse to furnish performance security, in accordance with the ITB.

This guarantee shall expire: (a) if the Bidder is the successful bidder, upon our receipt of copies of the contract signed by the bidder and of the performance security issued to You by the Bidder, or (b) if the bidder is not the successful bidder, upon the earlier of (i) our receipt of a copy of your notification to the Bidder that the Bidder was unsuccessful, otherwise it will remain in force up to -------*(insert date)* Consequently, any demand for payment under this guarantee must be received by us at the office on or before that date.——————————————

[signature(s) of authorized representative (s)]

CONFIDENTIAL

## 3.4 තාක්ෂණික පිරිවිතර

**<u>සුහුරුපාය ගොඩනැගිලි සංකීර්ණයෙහි 14,17,18, සහ 19 මහල් පිරිසිදු කිරීමේ සේවාව සැපයිය යුතු ආකාරය</u>**

ප්‍රදේශය

| මහල | ප්‍රමාණය (වර්ග අඩි) |
|---|---|
| 14 වන මහල | වර්ග අඩි 22,247.05 |
| 17 වන මහල | වර්ග අඩි 19,486.96 |
| 18 වන මහල | වර්ග අඩි 18,055.37 |
| 19 වන මහල | වර්ග අඩි 1,130.21 |
| 'පියස' (Piyasa) හි පොලිස් නිෂ්කාශන ඒකකය- 'Ancillary B' ගොඩනැගිල්ල | වර්ග අඩි 450.90 |
| මුළු වර්ග අඩි ප්‍රමාණය | වර්ග අඩි **61,370.49** |

**වැසිකිළි ගණන :**

| මහල | පොදු වැසිකිළි | |
|---|---|---|
| | පිරිමි | කාන්තා |
| **1**4 වන මහල | 04 | 03 |
| 17 වන මහල | 04 | 03 |
| 18 වන මහල | 04 | 03 |
| 19 වන මහල | - | 01 |

CONFIDENTIAL

| | විස්තරය | කාල පරාසය | පහත කාර්ය ඉටුකිරීමට එකඟවෙමි / එකඟනොවෙමි |
|---|---|---|---|
| **01. බිම** | | | |
| 1.1 | කාර්යාල පරිශ්‍රයට අයත් සියලු ස්ථාන,සියලු පොදු ප්‍රවේශ, අවශේෂ අභ්‍යන්තර හා බාහිර පඩිපෙළ බහු කාර්ය පිරිසිදුකරණ උපකරණ භාවිතයෙන් පිස දැමීම, දූවිලි හරණය, මොප් කිරීම ((Dump Mopping) හා අතුගෑම | දිනපතා | |
| 1.2 | අපද්‍රව්‍ය/ කසල දමන බාස්කට්, ඩස්ට්බින් ආදියේ එකතුවන දෑ පිටතට ගෙන යෑම. (කසල අපහරණය) | වහාම | |
| 1.3 | තෙතමනය ඇති ස්ථාන වේලීම, තේ පැල්ලම්, පා සලකුණු යනාදිය ඉවත් කිරීම | වහාම | |
| 1.4 | කසල භාජන පිරිසිදු කිරිම,වේලීම, විෂබීජහරණය. | දිනපතා | |
| 1.5 | කාපට් හා බිම වැකුම් මඟින් පිරිසිදු කිරීම | සතිපතා | |
| 1.6 | කාපට් බිම පරීක්ෂා කිරීම හා ජල විසිරුණු තැන් හා අපවිත්‍ර බිම පිරිසිදු කිරීම | දිනපතා | |
| 1.7 | කාර්යාල භූමිය පිරිසිදු කර ඔප දැමීම | සතිපතා | |
| **02. වීදුරු දොරවල් / ජනේල, කියුබිකල් හා ඇතුලත වීදුරු** | | | |
| 2.1 | පිවිසුම් දොර පිරිසිදු කිරීම | දිනපතා | |
| 2.2 | වීදුරු ජනේල පිරිසිදු කිරීම | සතිපතා | |
| 2.3 | වීදුරුවල ලප ඉවත් කරන ද්‍රව්‍යයන් යොදා විදුරු පිරිසිදු කිරීම (විශේෂයෙන්ම දොර තල්ලු කරන ප්‍රදේශ තිබේනම් තහඩු ප්‍රදේශ ආශ්‍රිතව (Door push plate)) | දිනපතා | |
| 2.4 | සියලුම දොරවල් ජනේල සහ වීදුරු ආවරණ කොටස් (Glass Partition) වියලි රෙදි කැබලි හෝ කඩදාසි යොදා දූවිලි හරණය කර පිරිසිදු කිරීම | දිනපතා | |
| 2.5 | වීදුරු පිරිසිදු කරන ද්‍රව්‍ය (Glass Cleaner) යොදා වීදුරු ජනේල පිරිසිදු කරන කට්ටල මඟින් වීදුරු, වීදුරු ජනෙල්, ජනෙල් පඩි (දෙපැත්තම) සෝදා පිරිසිදු කිරීම | දිනපතා | |
| 2.6 | ජනේල හොඳින් සේදීම | මාසිකව | |
| **03. සිවිලිම, සියලුම පොදු ස්ථාන, පොදු ප්‍රවේශ අවශේෂ (Common Passages) හා තරප්පු** | | | |
| 3.1 | සිවිලිම දූවිලි හරණය කර පිරිසිදු කිරීම | දිනපතා | |
| 3.2 | බිත්තිවල හා සිවිලිමේ මකුළු දැල් හා මකුළුවන් ඉවත් කිරීම (බිත්ති මුළුවල විශේෂ අවධානය සහිතව) | වහාම | |

CONFIDENTIAL

| | | | |
|---|---|---|---|
| 3.3 | බල්බ් කට්ටල ,සිවිලිමේ විදුලි පංකා ,ටියුබ් බල්බ ,බල්බ ආවරණ දූවිලි හරණය කර පිරිසිදු කිරීම.( කාර්යය කිරිමට පෙර විදුලිය විසන්ධි කිරීමට සැලකිලිමත්වන්න) | සතිපතා | |
| **04. එමල්ෂන් තීන්ත ආලේපන සියළුම ඇතුළත බිත්ති ,පොදු ප්‍රවේශ අවකාශයන් (Common Passages) සියළුම තරප්පු** | | | |
| 4.1 | "General purpose detergent" යොදා ලප ඉවත් කිරීම | වහාම | |
| 4.2 | මල නොබැඳෙන වානේ කොටස් අත් වැට නාම පුවරු හා ගිණි නිවන උපකරණ සුදුසු රසායනිකයන් යොදවා පිරිසිදු කර ඔප කිරීම.(cleaning & polishing) | සතිපතා | |
| 4.3 | එමල්ෂන් ආලේපිත හා සියළුම බිත්ති කොටස් පිරිසිදු කිරීම හා ස්පොන්ජ් කිරීම. | සතිපතා | |
| **05. වැසිකිලි, වොෂ් රූම් (සෝදන කාමර)** | | | |
| 5.1 | පිනොල් වැනි විෂබීජ හරණ යොදා අතුල්ලා පිරිසිදු කිරීම. | දිනපතා | |
| 5.2 | I. වැසිකිලි/ වැසිකිලි තුළ කොමඩ්, සෝදන බේසම්, වතුර කරාම ඇතුළුව සියලුම උපකරණ පැල්ලම් ඉවත් කිරීම හා සෝදා පිරිසිදු කිරීම. | දවසට තුන්වරක් | |
| 5.3 | බිත්ති, බිම හා කාමර (කියුබිකල් ) පිරිසිදු කිරීම | දිනපතා | |
| 5.4 | පිනෝල් වැනි අනුමත ටොයිලට් සෝදන පිරිසිදු කරන රසායනිකයන් යොදා කැසිකිලි/වැසිකිලි තුල (ටොයිලට්) සියලුම උපකරණ සෝදා පිරිසිදු කිරීම. | දවසට තුන්වරක් | |
| 5.5 | විෂබීජ හරණ රසායනිකයන් යොදා දෙපැත්තෙහිම පදික ආවරණය (Pedestrian Cover) පිරිසිදු කිරීම | දිනපතා | |
| 5.6 | ජල ධාරකයන් කරාම අතිරික්ත ජලය ගලා බසින ස්ථාන (Over Flow Holes) පිරිසිදු කිරීම | දවසට තුන්වරක් | |
| 5.7 | නෙරා ඇති ( Tilled) බිත්ති පිරිසිදු කිරීම. | දිනපතා | |
| 5.8 | දීප්තිය දෙන ලෝහමය උපාංග පිරිසිදු කිරීම. | දිනපතා | |
| 5.9 | සින්ක් කුහර හා ගලි ආවරණ අතුල්ලා පිරිසිදු කිරීම. (sink holes & gullies trap) | දිනපතා | |
| 5.10 | කණ්ණාඩි, මල නොබැඳෙන ලෝහමය සවි කිරීම් ආදියේ පැල්ලම් ඉවත් කිරීම | දිනපතා | |
| 5.11 | වා කවුළු පිරිසිදු කිරීම. | සතිපතා | |
| 5.12 | කැඩපත හා වීදුරු ජනෙල් පිරිසිදු කිරීම. | සතිපතා | |
| 5.13 | සවිකර ඇති මල නොබැඳෙන උපාංග ඔප (පොලිෂ්) කිරීම. | සතිපතා | |
| 5.14 | මල බැඳුණු තැන් ඇත්නම් එම මලකඩ ඉවත් කිරීම. | වහාම | |
| 5.15 | මනා ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා ටොයිලට් හා වොෂ් රූම්/වැසිකිලි නාන කාමර පරීක්ෂා කර බැලීම. | පැයෙන් පැය | |
| 5.16 | සෝදන බේසම් වල, ගලිවල හා ජලය බැසයාම අවහිර වී ඇත්නම් ඒවා ඉවත් කර පිරිසිදු කිරීම. | වහාම | |

